**24-01-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, පරමාත්ම පියා ඔබට උගන්වන ඉගෙනුම බුද්ධියේ තබා ගෙන එය සැම දෙනාටම උගන්වන්න. සැම දෙනාටම පියා ගේ සහ ලෝක චක්‍රයේ හැඳින්වීම ලබා දෙන්න.

**ප්‍රශ්නය:** ජීවාත්මයන් ස්වර්ණමය යුගයේ සහ කලි යුගයේද ඔවුන් ගේ චරිත කොටස් රඟ පායි, එහෙත් එහි වෙනස කුමක්ද?

**පිළිතුර:** ස්වර්ණමය යුගයේදී, ජීවාත්මයන් ඔවුන්ගේ චරිත කොටස් රඟපාන විට ඔවුන් කිසිදු පාප කර්මයක් සිදු කරන්නේ නැත. එහි රාවන් නොමැති බැවින් ඔවුන් සිදු කරන සැම ක්‍රියාවක්ම උදාසීනයි. ඉන්පසු ජීවාත්මයන් කලි යුගයේ ඔවුන්ගේ චරිත කොටස් රඟපාන විට, මෙහි දුර්ගුණ පවතින බැවින්, සැම ක්‍රියාවක්ම පාප කර්මයකි. ඔබ දැන් සංගම් යුගයේ සිටින අතර ඔබට සැම දැනුමක්ම ඇත.

ඕම් ශාන්ති. ඔය දරුවන් අසුන්ගෙන සිටින්නේ බාබා ඉදිරියේ බව ඔබ දනී. ඔය දරුවන් ඔහු ඉදිරියේ අසුන්ගෙන සිටින බව බාබා ද දනී. පරම පියා ඔබට ඉගැන්වීම් ලබා දෙන බවත්, ඉන්පසු ඔබ ඒවා අන් අයට ලබා දිය යුතු බවත් ඔබ දනී. පළමුවෙන්ම පරම පියාගේ හැඳින්වීම ලබා දෙන්න, මන්ද සැම කෙනෙක්ම පියාව සහ ඔහුගේ ඉගැන්වීම් අමතක කර දමා ඇති බැවින්. පියා ඔබට දැන් ලබා දෙන ඉගැන්වීම් නැවත වසර 5000කට පසුව ලබා දෙයි. වෙන කිසි කෙනෙකුට මෙම ඥානය නොමැත. ප්‍රධානතම දේ පරමාත්ම පියාගේ හැඳින්වීමයි. ඉන්පසු අපි සියල්ලන්ම සහෝදරයන් බව ඔබ විස්තර කර දිය යුතුයි. ලෝකයේ සියලුම ජීවාත්මයන්ද සහෝදරයන්ය. සැම කෙනෙක්ම තමන්ට ලැබී ඇති චරිත කොටස තම ශරීරය තුළින් රඟපාමින් සිටියි. පරම පියා දැන් ඔබව දිව්‍යලෝකය යැයි කියන නව ලොවට රැගෙන යාමට පැමිණ ඇත. කෙසේවෙතත්, සහෝදරයන් වන අප සියල්ලම අපවිත්‍රයි. පාරිශුද්ධ එකදු කෙනෙක්වත් නැත. අපවිත්‍ර සියලු දෙනා පාරිශුද්ධත්වයට පමුණුවන්නේ එකම පරම පියා පමණයි. මෙය රාවන් ගේ අපවිත්‍ර, දූෂ්‍ය, සහ දූෂිත ලෝකයයි. රාවන් යනු ස්ත්‍රීන්ගේ දුර්ගුණ පහ සහ පිරිමින්ගේ දුර්ගුණ පහයි. බාබා ඉතා සරළ අන්දමකින් විස්තර කර දෙයි. ඔබටද එම අයුරින්ම විස්තර කළ හැක. එබැවින් පළමුවෙන්ම ඔහු අප සැම දෙනාගේම පියා බව විස්තර කරන්න. අප සියලුම දෙනා සහෝදරයන්ය. මෙයට එකඟ දැයි ඔවුන් ගෙන් විමසන්න. අප සියලුම දෙනා සහෝදරයින් බවත් අපගේ පියා එක්කෙනෙකු බවත් ඔවුන්ට ලියන්නට යැයි කියන්න. අප සියලුම ජීවාත්මයන්ගෙන්, උත්තරීතර ජීවාත්මය ඔහුයි. ඔහුට පරමාත්ම පියා යැයි කියයි. මෙය ස්ථිරව ඔවුන්ගේ බුද්ධියේ පැලපදියම් වීමට සලස්වන්න, එවිට වර්තමානයේ ඔවුන් තුළ ඇති සර්ව ව්‍යාප්ත සංකල්පය නැති වනු ඇත. පළමුවෙන්ම ඔවුන්ට ඇල්ෆා ගැන උගන්වන්න. ඔවුන්ට කියන්න මෙය පැහැදිලිව ලියාගන්න පෙර කල ඔහු සර්ව ව්‍යාප්තයි කියා මම කියූ නමුත්, දැන්, ඔහු සර්ව ව්‍යාප්ත නොවන බව සහ අප සියලුම දෙනා සහෝදරයින් බව මට වැටහෙයි. සියලුම ජීවාත්මයන් දෙවි පියා, උත්තරීතර පියා ගැන කතා කරයි. පළමුවෙන්ම ඔවුන් සියලුම දෙනා ජීවාත්මයන් බවත්, ඔවුන් උත්තරීතර ජීවාත්මය නොවන බවත්, පරමාත්ම දෙවියන් අප තුළ නො සිටින බව යන විශ්වාසය තහවුරු කරන්න. සියලුම දෙනා තුළ ජීවාත්මයක් සිටියි. ජීවාත්මයන් තම චරිත කොටස, ශරීරයේ ආධාරය ඇතිව රඟපායි. මෙය තදින් ස්ථිර කරගන්න! අච්චා, පරම පියා ඉන්පසු අපට ලොවෙහි මුල, මැද සහ අවසානය පිළිබඳ ඥානය ද ලබා දෙයි. මෙම ලෝක චක්‍රයේ වයස කීයද කියා වෙන කිසිම කෙනෙක් නොදනී. පරමාත්ම පියා පමණයි, ගුරුවරයාගේ ස්වරූපයෙන් අසුන්ගෙන සිටින විට අපට මෙය විස්තර කර දෙන්නේ. එය වසර සිය දහස් ගණනක් පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි. මෙම චක්‍රය නිවැරදි මෙන්ම පෙර තීරණය වූවක්ය. ඔබ මෙය වටහා ගත යුතුයි. ස්වර්ණමය සහ රිදීමය යුගයන් දැන් අතීතය වී ඇති බව සටහන් කර ගන්න. දේවතාවන්ගේ රාජධානිය පවතින, දිව්‍යලෝකය සහ අර්ධ දිව්‍යලෝකය යැයි ඒවාට කියයි. එකක දිව්‍යමය අංශක 16ක්ද අනිකෙහි දිව්‍යමය අංශක 14ක්ද ඇත. අංශක ක්‍රම-ක්‍රමයෙන් අඩුවීගෙන යයි. ලෝකය අනිවාර්යෙන්ම පරණ වෙයි. ස්වර්ණමය යුගයේ බලපෑම ඉතා විශාලයි. එහි නමම දිව්‍යලෝකයයි, නව ලොවයි. ඔබ නිකම්ම එය වර්ණනා කළ යුතුයි. නව ලොවෙහි ඇත්තේ එක් ආදි සනාතන දෙවි දේවතා ධර්මය පමණයි. පළමුව පියාගේ හැඳින්වීම ලබා දී ඉන්පසු ලෝක චක්‍රය ගැන කියන්න. ඔවුන්ට විශ්වාසය ඇති කරවීම සඳහා ඔබට පිංතූරද තිබේ. මෙම ලෝක චක්‍රය නොකඩවා බ්‍රමණය වෙයි. ස්වර්ණමය යුගයේ එය ලක්ෂ්මි සහ නාරායනගේ රාජධානිය වූ අතර, රිදීමය යුගයේ එය රාමා සහ සීතාගේ රාජධානිය විය. එය චක්‍රයෙන් භාගයකි. එම යුග දෙක පසු වූ පසු තඹමය යුගය

සහ කලි යුගය පැමිණෙයි. රාවන්ගේ රාජධානිය ආරම්භ වන්නේ තඹමය යුගයේදීය. දුර්ගුණයන්ගේ ක්‍රමය ඇති වන්නේ දේවතාවන් පාපයන්ගේ මාර්ගයට ගිය විටයි. ස්වර්ණමය සහ රිදීමය යුගයන්හිදී සියලුම දෙනා දුර්ගුණයන්ගෙන් තොරයි. එහි ඇත්තේ ආදි සනාතන දෙවි දේවතා ධර්මය පමණයි. මෙම පිංතූර සෑම දෙනාටම පෙන්වා, පරම පියා අපගේ ගුරුවරයා බවට පත්වී අපට මේ අන්දමින් උගන්වන අයුරුද මුවින් විස්තර කරන්න. පරමාත්ම පියාම පැමිණ තමන්ගේ හැඳින්වීම ලබා දෙයි. ඔහුම පවසන්නේ මම පැමිණෙන්නේ අපවිත්‍ර අය පාරිශුද්ධ කිරීමටයි. එබැවින් මට අනිවාර්යෙන්ම ශරීරයක් අවශ්‍යයි. නැත්නම් මම කතා කරන්නේ කෙසේද? මම සජීවී ජීවයයි, සත්‍යයයි එමෙන්ම අමරණීය කෙනාය. ජීවාත්මයන්, සතෝ, රජෝ සහ තමෝ තත්ත්ව පසු කරයි. අපවිත්‍ර වන්නේද පාරිශුද්ධ වන්නේද ජීවාත්මයන්ය, මේ නිසයි පවිත්‍ර ජීවාත්ම සහ අපවිත්‍ර ජීවාත්ම යැයි කියන්නේ. සියලුම සංස්කාර ඇත්තේ ජීවාත්මය තුළයි. අතීත සංස්කාර සහ පාප කර්මයන් ගෙන යන්නේ ජීවාත්මයයි. ස්වර්ණමය යුගයේදී පාප කර්මයන් නොමැත. ඔබ ක්‍රියාවන් කරමින් ඔබගේ කොටස් රඟපායි, එහෙත් එම ක්‍රියාවන් උදාසීනයි. මෙම වදන් ගීතාවේද සඳහන් වෙයි, දැන් ඔබ ඒවා ප්‍රායෝගිකව වටහා ගනී. බාබා පැමිණ ඇත්තේ පැරණි ලොව වෙනස් කර අළුත් ලොව සෑදීමට බව ඔබ දනී. ක්‍රියාවන් උදාසීන වන්නේ ස්වර්ණමය යුගයේදීය. සෑම ක්‍රියාවක්ම පාපකාරී වන විට එයට කලි යුගය යැයි කියයි. ඔබ දැන් සිටින්නේ සංගම් යුගයේය. බාබා ඔබට දෙපැත්තම ගැන සෑම දෙයක්ම කියයි. ස්වර්ණමය සහ රිදීමය යුගයන්, පාපයන් නොමැති පාරිශුද්ධ ලොවයි. පාපයන් ආරම්භ වන්නේ රාවන් ගේ රාජධානයි ආරම්භ වූ විටයි. එහි දුර්ගුණ පිළිබඳ සඳහනක් නොමැත. රාමාගේ රාජධානියේ සහ රාවන්ගේ රාජධානියේ පිංතූර ඔබ ඉදිරියේ ඇත. මෙය ඉගෙනුමක් බව පරම පියා විස්තර කර දෙයි. පියා හැරුණු කොට වෙන කිසිවෙක් මෙය නොදනී. මෙම ඉගෙනුම ඔබගේ බුද්ධියේ රැඳී තිබිය යුතුයි. පරම පියා සිහිපත් කරන විට, චක්‍රයද ඔබගේ බුද්ධියට ඇතුළු වෙයි. ඔබට තත්පරයකදී සෑම දෙයක්ම මතක් වෙයි. ඒ ගැන කතා කිරීමට ඊට වඩා වැඩි කාලයක් ගත වෙයි. වෘකෂය මේ අන්දමින් වන අතර, එයින් වතුර මල් තුනක් මතු වෙයි. ඔබට ගසක් සහ එහි බීජය තත්පරයකදී සිහිපත් කළ හැක. මේ මේ ගසේ බීජයක් ඇති අන්දමින් සහ එය මත ගෙඩි හටගන්නා අන්දමටම, මෙය අසීමිත මිනිස් ලෝක වෘකෂය වන අයුරු සහ එහි වැදගත්කම ඔබට විස්තර කළ හැක. චක්‍රයෙන් භාගයකට රාජධානිය දිගටම පැවතෙන අන්දම සහ ඉන්පසු රාවන්ගේ රාජධානිය ඇතිවන අන්දම පිළිබඳ සෑම දෙයක්ම ඔය දරුවන්ට විස්තර කර දී ඇත. ස්වර්ණමය සහ රිදීමය යුගයන්හි වැසියන් ඉන්පසු තඹමය යුගයේ වැසියන් බවට පත්වෙයි. වෘකෂය නොකඩවා වෙඩයි. චක්‍රයෙන් භාගයකට පසු සියලුම දෙනා දූෂ්‍ය වූ පසු රාවන් ගේ රාජධානිය ආරම්භ වෙයි. පියාගෙන් ඔබ ලැබූ උරුමය චක්‍රයෙන් භාගයක්ම ඔබ ළඟ පැවතුනි. ඔහු ඔබට ඥානය ලබා දී ඉන්පසු ඔබට ඔබගේ උරුමය ලබා දුන්නේය, එනම්, ඔබ තිළිණය අත්වින්දේය, එනම්, ස්වර්ණමය සහ රිදීමය යුගයන්හිදී ඔබ සතුට අත්වින්දේය. එයට කියන්නේ සතුටේ දේශය කියාය, එනම්, ස්වර්ණමය යුගය. එහි දුක නොමැත. සෑම දෙයක්ම ඔබට ඉතාම සරළ අන්දමකින් විස්තර කර දෙයි. ඔබ එක් අයෙකුට විස්තර කළත් බොහෝ දෙනෙකුට විස්තර කළත් ඔබ ඔබගේ අවධානය යොමු කළ යුතුයි. ඔබ විස්තර කරන විට, ඔවුන් එකඟතාවය පල කිරීමට හිස වැනුවත්, ඔවුන්ට ඒවා සටහන් කිරීමට කියා ඔබ කිව යුතුයි, ඒ සමගම ඔවුන්ට යම් සැකයක් ඇත්නම් ඒ ගැන විමසිය හැක. වෙන කිසිවෙක් නොදන්නා දේවල් අපි ඔබට විස්තර කරන්නෙමු. ඔවුන් කිසි දෙයක් නොදනී, ඉතිං ඔවුන් කුමක් අසන්නද? බාබා අසීමිත වෘකෂයේ වැදගත්කම ඔබට කියයි. ඔබ මෙම ඥානය මේ කාලයේදී වටහා ගනී. ඔබ උපත් 84හි චක්‍රය වටා යන අන්දම පරම පියා ඔබට කියා ඇත. මෙය ඉතා ප්‍රවේසමෙන් සටහන් කර ගෙන ඉන්පසු ඒ ගැන සිතන්න. ගුරුවරයෙක් ඔබට නිවසේදී පුනරිකෂණය කිරීම සඳහා රචනාවක් දෙන අන්දමට, ඒ හා සමානව, මෙම ඥානය වෙනත් අයට දී, ඉන්පසු වෙන දේ බලන්න. ඔවුන් ගෙන් දිගටම ප්‍රශන් කරන්න. සෑම කරුණක්ම ඔවුන්ට ඉතා පැහැදිලිව විස්තර කර දෙන්න. පියාගේ යුතුකම්ද, පසුව ගුරුවරයාගේ සහ ඉන්පසු ගුරුගේ යුතුකම්ද විස්තර කරන්න. අපවිත්‍ර අපව, පැමිණ පාරිශුද්ධත්වයට පත් කරන්න යැයි, ඔබ ඔහුට අඬ ගැසුවේය. ජීවාත්මයන් පාරිශුද්ධ වන විට ඔවුන්ට පාරිශුද්ධ ශරීර ලැබෙයි. රත්රං කෙසේද, ඉන් සාදන ආභරණද එසේමය. ඔබ කැරට් 24 රත්රං ගෙන මිශ්‍රක කිසිවක් නොයොදන්නේ නම්, ඉන් සාදන ආභරණද සතෝප්‍රධාන් වෙයි. ඔබට අපද්‍රව්‍ය මිශ්‍ර වී ඇති බැවින්, ඔබ තමෝප්‍රධාන් වී ඇත. මුලදී භාරතය කැරට් 24 හි රත්රං පකෂියෙක් වීය, එනම්, එය සතෝප්‍රධාන් නව ලොව වීය. ඉන්පසු එය තමෝප්‍රධාන් විය. පරමාත්ම පියා පමණයි මෙය විස්තර කරන්නේ. කිසිම මනුෂ්‍යයෙක් හෝ ගුරු කෙනෙක් මෙය නොදනී. පැමිණ ඔබව පාරිශුද්ධත්වයට පත් කරන්න යැයි ඔබ ඔහුට අඬ ගැසුවේය. කෙසේවෙතත්, එය ගුරු ගේ කාර්යයයි. මිනිසුන් ඔවුන්ගේ විශ්‍රාමික තත්ත්වයට පත් වන විට ගුරු කෙනෙක් ලබා ගනී. ශබ්දයෙන් එහා ස්ථානය, ජීවාත්මයන් වෙසෙන අශාරීරික ලෝකයයි. මෙය ශාරීරික ලෝකයයි. මෙය, ඒ දෙකේ හමුවීමයි. එහි ශරීර නොමැත. එහි

ක්‍රියාවන් සිදු කරන්නේ නැත. පරම පියාට සියලුම ඥානය තිබේ. නාටකයේ සැලසුමට අනුව, ඔහුට, ඥානයෙන් පරිපූර්ණ යැයි කියයි. ඔහු සජීවී ජීවය, සත්‍යය මෙන්ම ආනන්දයෙන් පිරි කෙනා බැවින්, ඔහුට ඥානයෙන් පිරිපුන් යැයි ද කියයි. ඔබ ඔහුට පාරිශුද්ධත්වයට පමුණුවන්නා සහ ඥානයෙන් පිරිපුන් ශිව් බාබා යැයි කියයි. ඔහු ගේ නම සදාකාලිකවම ශිවාය. සියලුම ජීවාත්මයන් පහතට විත් ඔවුන්ගේ චරිත කොටස් රඟපෑම සඳහා විවිධ නම් ගනී. ඔවුන් පියාට අඬ ගසන මුත්, ඔවුන්ට කිසි දෙයක් වැටහෙන්නේ නැත. ඔහු තුළට පරමාත්ම පියා පැමිණ ඔබව පාරිශුද්ධ ලෝකයට රැගෙන යෑමට, අනිවාර්යෙන්ම භාග්‍ය රථය තිබිය යුතුයි. එබැවින් පරම පියා විස්තර කරන්නේ සුමිහිරි දරුවනි, ඔහුගේ බොහෝ උපත් වල අවසන් උපතෙහි සිටින මෙම කෙනා ගේ ශරීරය තුළින් මා පැමිණෙන්නෙමි. ඔහු සම්පූර්ණ උපත් 84 ම ගනී. මා භාග්‍ය රථයෙන් පැමිණිය යුතුයි. අංක එකට ඇත්තේ ශ්‍රී ක්‍රිෂ්ණාය. ඔහු නව ලොවෙහි අධිපතිය. ඉන්පසු ඔහු පහතට එයි. ස්වර්ණමය යුගයෙන් පසු, ඔහු රිදීමය, තඹමය සහ කලි යුගය තුළින් යයි. ඔබ දැන් යකඩ වලින්, රත්රං බවට පත් වෙමින් සිටියි. පියා පවසන්නේ ඔබගේ පරම පියා වන මා සිහිපත් කරන්න එපමණයි! මා ඇතුළු වුණු ශරීරයේ, ජීවාත්මය තුළ ඥානය තිබුණේ නැත. මා ඔහු තුළට ඇතුළු වන නිසයි ඔහුට භාග්‍ය රථය යැයි කියන්නේ. එසේ නැත්නම්, සැමට වඩා ශ්‍රේෂ්ඨ වන්නේ ලකෂ්මී සහ නාරායනය. එබැවින් මම ඔවුන් දෙදෙනා ගෙන් කෙනෙක් තුළට ඇතුළු විය යුතුයි. කෙසේවෙතත්, පරමාත්ම දෙවියන් ඔවුන් තුළට ඇතුළු වන්නේ නැත. මේ නිසයි ඔවුන් දෙදෙනාගෙන් එක්කෙනෙකුටවත් භාග්‍ය රථය යැයි කිව නොහැක්කේ. මෙම රථයෙන් පැමිණ ඔහු අපවිත්‍ර අය පාරිශුද්ධත්වයට පත් කළ යුතුයි. එබැවින් මෙම කෙනා අනිවාර්යෙන්ම කලි යුගියෙක් මෙන්ම තමෝප්‍රධාන්ද විය යුතුයි. ඔහුම පවසන්නේ මම මෙම කෙනාගේ බොහෝ උපත් වල අවසන් උපතෙදි පැමිණෙන්නෙමි. මෙම වදන් නිවැරදිව ගීතාවේ සඳහන් වී ඇත. සියලුම ග්‍රන්ථ වලින් ශ්‍රේෂ්ඨතම මැණික යැයි කියන්නේ ගීතාවටයි. පරමාත්ම පියා පැමිණ බ්‍රහ්මන සහ දේවතා වංශ ස්ථාපනය කරන්නේ මෙම සංගම් යුගයෙදීය. පරම පියා පැමිණෙන්නේ බොහෝ උපත් වල අවසන් උපතෙදී, එනම්, ඔහු පැමිණෙන්නේ සංගම් යුගයෙදීය. ඔහු පවසන්නේ මම බීජයයි. ක්‍රිෂ්ණා ස්වර්ණමය යුගයේ වැසියෙකි. ඔහු වෙන කිසිම ස්ථානයක දැකිය නොහැක. පුනරුත්පත්ති ගැනීමේදී, නම, ස්වරූපය, දේශය සහ කාලය යන සියල්ල වෙනස් වෙයි. මුහුණුවර පවා වෙනස් වෙයි. මුලදී පොඩි දරුවෙක් ඉතාම ලස්සණයි, ඉන්පසු ඔහු වෙඩයි. ඔහු ඉන්පසු එම ශරීරය අතහැර නැවතත් කුඩා ශරීරයක් ගනී. මෙම රංගනය පෙර තීරණය වී, නාටකයේ ස්ථිර වී ඇත. ඔහු ඊලඟ ශරීරය ගත් විට, ඔහුට තව දුරටත් ක්‍රිෂ්ණා යැයි කිව නොහැක. ඊලඟ ශරීරයට වෙනස් නමක් දෙයි. කාලය, මුහුණුවර, දිනය, මොහොත යනාදී සියල්ලම වෙනස් වෙයි. ලොවෙහි ඉතිහාසය සහ භූගෝලය එම අන්දමින්ම කිසිදු වෙනසක් නොමැතිව නැවතත් සිදුවෙයි. එබැවින් මෙම නාටකය නොකඩවා නැවත සිදුවෙමින් පවතී. ඔබ සතෝ, රජෝ සහ තමෝ යන තත්ත්ව තුළින් යා යුතුයි. ලොවෙහි නම සහ යුගයේ නම නොකඩවා වෙනස් වෙයි. මෙය දැන් සංගම් යුගයයි. මම පැමිණෙන්නේ සංගම් යුගයෙදීය. මම මුළු ලොවෙහිම සත්‍ය ඉතිහාසය සහ භූගෝලය ඔබට කියන්නෙමි. වෙන කිසිම කෙනෙක් යුගයේ මුල සිට අවසානය දක්වා සැම දෙයක්ම දන්නේ නැත. ස්වර්ණමය යුගයේ කාල වකවානුව නොදන්නා බැවින් ඔවුන් වසර සිය දහස් ගණනක් ගැන කියා ඇත. මේ සැම දෙයක්ම දැන් ඔබගේ බුද්ධිය තුළ ඇත. තමන් තුළ මෙය ස්ථිර කර ගන්න පියා, පියා මෙන්ම, ගුරුවරයා සහ සත්ගුරු ද වන්නේය, ඔහු අපට නැවත වරක් සතෝප්‍රධාන් වීම සඳහා ඉතා හොඳ ක්‍රම ලබා දෙයි. ගීතාවේ මෙසේද කියයි තමන්ගේ ශරීරය ඇතුළු සියලුම ශාරීරික ආගම් අතහැර, තමන් ජීවයක් යැයි සළකන්න! ඔබ අනිවාර්යෙන්ම ආපසු නිවහනට යා යුතුමයි. භක්ති මාර්ගයේ, ඔවුන් දෙවියන් ලබා ගැනීමට බොහෝ උත්සාහයන් දරයි. මෙය ඔවුන් ක්‍රියාවන් ගෙන් නිදහස් වන විමුක්තියේ දේශයයි. අප ගොස් අශාරීරික ලොවෙහි අසුන් ගනී. නළුවෙක් ගෙදර ගිය විට ඔහු රඟපාන කොටසින් ඔහු නිදහස ලබයි. සැම කෙනෙකුටම විමුක්තිය ලබා ගැනීමට උවමනාය. කිසි කෙනෙකුට සදාකාලික විමුක්තිය ලබා ගත නොහැක. මෙම නාටකය සදාතනිකයි, අවිනාශීයි. සමහරු පැමිණෙන සහ පිට වන කොටසට තමන් අකමැති බව කියයි. කෙසේවෙතත්, ඒ ගැන කිසිවෙකුට කිසිවක් කළ නොහැක. මෙම සදාකාලික නාටකය පෙර තීරණය වූ එකකි. එක්කෙනෙකුටවත් සදාකාලික විමුක්තිය ලබා ගත නොහැක. ඒ සැම දෙයක්ම විවිධ වූ මනුෂ්‍ය මතය. මේවා ඔබව, සැමටම වඩා ශ්‍රේෂ්ඨ කරවීම සඳහා ඇති ශ්‍රේෂ්ඨ උපදෙස්ය. මනුෂ්‍යයින්ට ශ්‍රේෂ්ඨ (ශ්‍රී) යැයි නොකිව යුතුයි. දේවතාවන්ට ශ්‍රේෂ්ඨ යැයි කියයි. සැම කෙනෙක්ම ඔවුන්ට (ප්‍රතිමාවලට) හිස නමයි. මේ ඔවුන් ශ්‍රේෂ්ඨ නිසයි. ක්‍රිෂ්ණා දේවතාවෙකි, දිව්‍යලෝකයේ කුමරාය. ඔහු මෙහි පැමිණෙන්නේ කෙසේද? ඔහු ගීතාව කීවේ නැත. මිනිසුන් ශිවාගේ ඉදිරියට ගොස් ඔහුගෙන් විමුක්තිය ඉල්ලති. ඔහු ජීවන-මුක්තියට වත් ජීවන-බන්දනයට වත් නොයයි. එබැවින් මිනිසුන් විමුක්තිය උදෙසා ඔහුට අඬ ගසති. ඔහු ජීවන-මුක්තියද ලබා දෙයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ජීවාත්මයන් වන අප සෑම දෙනාම සහෝදරයින්ය. මෙම පාඩම ස්ථිර කර ගෙන, අන් අයටත් එය කිරීමට පොළඹවන්න. සිහිපත් කිරීම තුළින් තම සංස්කාර සම්පූර්ණයෙන්ම පාරිශුද්ධත්වයට පත් කරන්න.
2. කැරට් 24 හි පිරිසිදු රත්රං වීම සඳහා (සතෝප්‍රධාන්), කර්මය, උදාසීන කර්මය සහ පාප කර්ම යන ගැඹුරු න්‍යාය ඔබගේ බුද්ධියේ තබා ගෙන තව දුරටත් කිසිම පාප කර්මයක් සිදු නොකරන්න.

**වරදානය:** ඔබ මාස්ටර් දැනුමින් පිරිපුන් වී, බියෙන් නැටීම වෙනුවට, නිරන්තරයෙන් සතුටින් නර්ථනය කරත්වා.

මාස්ටර් දැනුමින් පිරිපුන් දරුවන්, බියෙන් නටන්නේ නැත. දැන්, එක මොහොතකින් එම ඉනිමග නැඟ ඊළඟ මොහොතේ පහළට එන සංස්කාරය වෙනස් කරන්න, එවිට ඔබ ඉතා වේගයෙන් ඉදිරියට යයි. ඔබගේ අධිකාරිත්වය සහ දැනුම සහ පවුලින් ලැබෙන සහයෝගය සරළව භාවිතා කර, ඔබගේ අත, පියාගේ හස්තය තුළ දිගටම තබා ගන්න. එවිට ඔබ නොකඩවා සතුටින් නර්ථනය කරයි; එවිට බියේ නර්ථනයක් තිබිය නොහැක. කෙසේවෙතත්, බියේ නර්ථනය සිදු වන්නේ ඔබ මායාගේ අත අල්ලා ගත් විටයි.

**පාඨය:** තම සිතිවිලි සහ ක්‍රියා ශ්‍රේෂ්ඨ වන අය, මාස්ටර් සර්ව බලධාරීන්ය.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: මෙම අව්‍යක්ත මාසයේ, බන්ධනයෙන් නිදහස් වී ජීවන මුක්ති අවධිය අත්විඳින්න.**

මාස්ටර් ත්‍රිකාලදර්ශී අයකු ලෙස සෑම ක්‍රියාවක්ම සිදුකරන්න, සෑම සිතිවිල්ලක්ම නිර්මාණය කරන්න සහ සෑම වචනයක්ම කතා කරන්න, එවිට කිසිදු ක්‍රියාවක් නිෂ්පල හෝ අර්ථ විරහිත නොවනු ඇත. ත්‍රිකාලදර්ශී වීම යනු ඔබ ඔබේ භෞතික අවයව සමඟ වැඩ කරන විට නොබැඳි නිරීක්ෂකයෙකුගේ අවධියේ ස්ථාවර වීමයි. එවිට ඔබට එම ක්‍රියාවන්ගෙන් බලපෑමක් ඇති නොවේ. නිරන්තරයෙන් ඔබේ කාර්යයෙන් නොබැඳි වූ විට ඔබේ ක්‍රියාවන්හි බන්ධනයක් නොමැති අතර එවිට ඔබ ඔබේ ඉහළම අවධියට ළඟා වනු ඇත.